# පේරාදෙණිය විශ්වවිද්‍යාලය
# ප්‍රසම්පාදන දැන්වීමයි

## පශු වෛද්‍ය පීඨ සත්ව ගොවිපල සඳහා කම්කරු සේවය සැපයීම

පේරාදෙණිය විශ්වවිද්‍යාල පශු වෛද්‍ය පීඨයේ සත්ව ගොවිපල සඳහා කම්කරු සේවය සැපයීමට හැකි පිළිගත් ආයතන හා ක්ෂේත්‍රයේ පළපුරුදු සැපයුම්කරුවන්ගෙන් තරඟකාරී මිළ ගණන් යටතේ ලංසු කැඳවනු ලැබේ.

**(සත්ව ගොවිපල ආශ්‍රිත සේවාවන්හි පළපුරුදු සැපයුම්කරුවන් පමණක් මේ සඳහා මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.)**

- පිරිමි සේවකයින් 06 ක් හා ගැහැණු සේවකයින් 06 ක් දින 365 ක කාලයක් තුළ අඛන්ඩ සේවයේ යෙදවීමට අපේක්ෂා කෙරේ.
- ආපසු නොගෙවනු ලබන රු. 2,000.00 ක ලංසුපත් ගාස්තුවක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සරප් අංශය වෙත ගෙවා අදාළ ටෙන්ඩර්පත් එම අංශයෙන් ලබා ගත හැකිය.
- මෙම ලංසුපත් 2022.09.19 දින සිට 2022.10.18 දින දක්වා වැඩ කරන දිනයන්හි පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා නිකුත් කරනු ලබන අතර, මුද්‍රා තබන ලද මිල ගණන් 2022.10.19 වන දින ප.ව 1.30 ට හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, ප්‍රසම්පාදන කමිටුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ලේඛකාධිකාරි කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ සිදු කළ හැකිය. (සරප් අංශය විසින් නිකුත් කරනු ලබන රිසිට්පත ලබා ගැනීම අනිවාර්යය වේ)
- මෙම ලංසුපත් 2022.10.19 දින ප.ව 1.30 ට විවෘත කරනු ලබන අතර ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට මේ සඳහා සහභාගි විය හැක. ලංසුපත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ" **පශු වෛද්‍ය පීඨ සත්ව ගොවිපල සඳහා කම්කරු සේවය සැපයීම 2022/2023 - GSD/VET/GEN/2022-2023**" යනුවෙන් සඳහන් කිරීම අනිවාර්යය වේ.
- සත්ව ගොවිපල ආශ්‍රිත සේවාවන්හි පළපුරුදු සැපයුම්කරුවන් මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන්නේ නම් 2022.09.29 දින පෙ.ව. 10.00 පශු වෛද්‍ය පීඨයේ පීඨාධිපති කාර්යාලය වෙත පැමිණ පශු වෛද්‍ය පීඨයේ සත්ව ගොවිපල නිර්ක්ෂණය කල හැකි අතර එදින සහභාගි නොවන සැපයුම්කරුවන්ට නැවත ස්ථානීය පරික්ෂණයක් සිදු කිරීමට නොහැක.
- සියළුම ලංසුපත් සමඟ වාර්ෂික ලංසු වටිනාකමින් (බදු රහිත) 1% ක වටිනාකමකින් යුත් ලංසු සුරක්ෂිතයක් (මෙය ලංසු විවෘත කල දිනයේ සිට ඉදිරියට දින 120 ක් සඳහා වලංගු විය යුතුය) **''උපකුලපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලය''** නමින් තැබිය යුතු අතර එය ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් අනුමත කර ඇති රාජ්‍ය හෝ වාණිජ බැංකුවකින් ලබා ගන්නා ලද හෝ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සරප් අංශය වෙත මුදල් තැන්පත් කර ලබාගත් ලංසු සුරක්ෂිතයක් හෝ විය යුතුය.
- සියළු රක්ෂණ සමාගම් මඟින් ඉදිරිපත් කරනු ලබන ඇප සුරක්ෂිත හෝ චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

*වැඩි විස්තර පහත සඳහන් දුරකථන අංක ඇමතීමෙන් ලබා ගත හැකි වේ.*

අංශාධිපති/ පශු වෛද්‍ය පීඨ සත්ව ගොවිපල හා සත්ව නිෂ්පාදන අධ්‍යයන අංශය - 081 - 2385936

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි/ පශු වෛද්‍ය පීඨය - 081 - 2385707

නියෝජ්‍ය ලේඛකාධිකාරි / පාලන අංශය - 081 - 2382438

**සභාපති**
**විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව**